# පුරප්පාඩු

## සහකාර කර්මාන්තශාලා කළමනාකරු/ කර්මාන්තශාලා කළමනාකරු තනතුර

### (ස්ථිර / කොන්ත්‍රාත්)

**තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ සහකාර කර්මාන්තශාලා කළමනාකරු/කර්මාන්තශාලා කළමනාකරු තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

| බාහිර අයදුම්කරුවන් | අභ්‍යන්තර අයදුම්කරුවන් |
|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබාතිබීම.<br>සහ<br>රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ඇති තේ කර්මාන්තශාලාවක තේ නිෂ්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද, ඉන් අවම වසර 05 ක් වත් සීටීසී තේ නිෂ්පාදනය හා වසර 05ක් වත් ඕතඩොක්ස් තේ නිෂ්පාදනය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම. | බාහිර සුදුසුකම් හෝ තේ කර්මාන්තශාලාවක තේ නිෂ්පාදනය පිළිබඳ වසර 15ක පළපුරුද්ද, ඉන් අවම වශයෙන් වසර 05 බැගින් සීටීසී හා ඕතඩොක්ස් තේ නිෂ්පාදනය පිළිබඳ පළපුරුද්දක් තිබීම සහ කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබාතිබීම. |

**වයස**

අවු: 35ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

| මාසික වැටුප් පරිමාණය | අනෙකුත් වරප්‍රසාද |
|---|---|
| කළමනාකරණ සේවා 2/2016 චක්‍රලේඛනය අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.<br>MM 1- 1 රු. 53,175/- 10 x 1,375/- 15 x 1,910/- 95,575/-<br>වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු. 7,800.00 ක්, රජයේ අනුමත දීමනාව රු. 5,000.00 ක් ඇතුළු රජයේ අනුමත අනෙකුත් දීමනා හා වරප්‍රසාද. | • නිල නිවසක් හෝ ඒ සඳහා දීමනාවක්<br>• නිල වාහනයක් හෝ ඒ සඳහා දීමනාවක්<br>• ඉන්ධන හෝ ඒ සඳහා දීමනාවක්<br>• කර්මාන්තශාලා කළමනාකරුවන්ට ලබා දෙනු ලබන කම්කරු පහසුකම්/ කම්කරු දීමනා<br>• ආකර්ශනීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)<br>• සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්<br>• කාර්යය සාධනය මත දෙනු ලබන දීමනා<br>• වාර්ෂික ප්‍රසාද දීමනා<br>• දූරකථන දීමනාව<br>• තේ කොළ දීමනාව<br>• තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද හා වෙනත් ප්‍රතිලාභ |

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලි අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ ආකෘතියට (kalubowitiyanatea.lk වෙබ් අඩවියෙන් බාගත හැක) අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2023.08.18 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**